චක්‍රලේඛ අංක: 13/2019

මාගේ අංකය: DO1/01/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත
අංක 109,
මහ වීදිය ,
බත්තරමුල්ල.
2019.12.26

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සණස සමිති හා අනෙකුත් සියලු ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>සමිති වල උසස් නිලධාරීන් බඳවා ගැනීමේදී අයදුම්පත් කැඳවීම</u>**

01. සමුපකාර සමිති සඳහා උසස් නිලධාරීන් බඳවා ගැනීමේදී අයදුම්පත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම් වෙත යොමු කළ යුතු බවට පූර්ව විධි විධාන නිකුත් කර තිබුණද, එසේ කටයුතු කිරීම මින් ඉදිරියට අවශ්‍යා නොවන බව දන්වනු ලැබේ.

02. එහෙත්, සමිතියේ පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමේදී අදාළ දැන්වීම් කෙටුම්පත සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත යොමුකර එකඟතාව ලබාගැනීමේ ක්‍රමවේදය ඉදිරියටත් අනුගමනය කළ යුතුය. ඉහත සඳහන් විධිවිධාන 2020.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලෙසට කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

සුමිත් සුරවීර
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත්:

I. ලේකම්, පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය, බස්නාහිර පළාත- කා.දැ.ස
II. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත- කා.දැ.ස